# මනෝවිද්‍යාවේ විකාශය

වෛද්‍ය නිරෝෂන් මෙන්ඩිස්



"ආත්මය" යන අරුත දෙන "Psyche" සහ "විෂයයක් හැදෑරීම"යන්න දැක්වෙන "Logos" යන වදන්වලින් බිඳී ආ, පුරාතනයේ විසූ බොහොමයක් චින්තකයින්ගේ සහ දාර්ශනිකයන්ගේ අවධානය යොමුවූ, එකී දෙවදන් එක්කොට ලියූ කළ "ආත්මය පිළිබඳ හැදෑරීම" යන අර්ථය ලබාදෙන භාෂිතයක් ලෙස "Psychology" යන්න හැඳුන්වා දිය හැකිය. සමහර විට, ක්‍රි.පූ. 400දී මනස සහ ශරීරය යන විෂය ආමන්ත්‍රණය කළ, සිතිවිලි ගොඩනැගීමේදී සහ ඉන්ද්‍රිය සංවේදී උත්තේජන පසුපස එන සංජානනයට අයත්වන පියවර සහ අවධි සවිස්තරාත්මකව විස්තර කරන ලද ගෞතම බුදුරජාණන් වහන්සේ මේ පිළිබඳව වූ වාර්තාවල මුලින්ම සඳහන් වන නාමය විය හැකිය. මෑත අතීතයේදී 16 වැනි සහ 17 වැනි ශතවර්ෂවල ජීවත් වූ ප්‍රංශ දාර්ශනිකයකු වූ රෙනේ ඩෙස්කාර්ටස් (Rene Descartes) යාන්ත්‍රික සිරුරෙන් මනස මූලික ලෙස වෙනස්වන බව සවිස්තරාත්මක ලෙස පැහැදිලි කළේය. ඔහුව අනුගමනය කරමින් බොහොමයක් යුරෝපීය දාර්ශනිකයෝ මේ විෂය පිළිබඳව තම තමන්ගේ මත ඉදිරිපත් කළෝය.



රෙනේ ඩෙස්කාර්ටස්


## "ව්‍යුහ මනෝවිද්‍යාව" සමගින් විධිමත් විෂයයක් ලෙස ඇරඹුණු මනෝවිද්‍යාව

ජර්මන් ජාතික මහාචාර්යවරයකු වූ Wilheim Wundt විසින් සිදු කරන ලද පුරෝගාමී කාර්යභාරය මගින් මනෝවිද්‍යාව විද්‍යාත්මක විෂයයක් ලෙස විධිමත් ආකාරයට පිළිගැනීම 1870දී සිදුවිය. තනි විෂයයක මානසික අත්දැකීම් ඛණ්ඩනය කිරීම මගින් මූලිකවම මනෝවිද්‍යාවේ අවධානය යොමු කළ යුතු බවට ඔහුගේ සැලකිල්ල යොමුවූ සවිඥානකභාවයේ පදනම අධ්‍යයනය කිරීමට ඔහු මුලපිරීය. එහෙයින්, හැසිරීම සහ මනෝක්‍රියාකාරිත්වය පිළිබඳව හැදෑරීමක් ලෙස නූතන මනෝවිද්‍යාව ආරම්භ විය. මහාචාර්ය Wilheim 1879දී ලෙයිප්සිග් (Leipzig) විශ්වවිද්‍යාලයෙහි මනෝවිද්‍යා පර්යේෂණාගාරයක් ස්ථාපිත කළ අතර පර්යේෂණ ප්‍රතිඵල වාර්තා කිරීම පිණිස මනෝවිද්‍යා වාර සඟරාවක් 1881 දී හෙතෙම ආරම්භ කළේය. වර්ණ දැකීම, පොතක පිටුවක් කියවීම්, හෝ ගණිත ගැටලුවක් විසඳීම හෝ වැනි මානසික කටයුත්තක යෙදීමේදී ඔවුනට අත්විඳීමට සිදුවන දෑ විස්තර කරන ලෙස පැවසීම මෙකී පර්යේෂණවලට අයත් විය. මෙම කටයුත්ත සිදුකිරීමේදී ඉන්ද්‍රිය සංවේදනයක් දැනෙන්නටවීම සහ සංවේදනය කුමක්දැයි වටහා ගැනීම හෝ සංඥානනයවීම හෝ අතර වෙනසක් ඇති හෙයින් මෙකී අවස්ථා දෙක අතර "ප්‍රතික්‍රියා කාලයක්" පැවතුණු බවත් ඔවුන්



Wilheim Wundt

විසින් වටහාගන්නට යෙදුණි. මෙකී විශ්ලේෂණාත්මක ප්‍රවේශය, සවිඥානකතාවය එහි මූලික අංගවලට විශ්ලේෂණය කිරීමත් එකී මූලික අංග කෙසේ එකිනෙක හා සම්බන්ධවේදැයි ගවේශනය කිරීමත් සිදු කෙරෙන්නාවූ, මනෝවිද්‍යාවේ එන නිකාය දෙකින් එකක් වන "ව්‍යුහ මනෝවිද්‍යාව" වෙත ඔහු මග පෙන්වීය. ව්‍යුහ මනෝවිද්‍යාව, යම් කෙනෙකුට අයත් වන ස්වසංඥානන අත්දැකීම් ප්‍රවේශම් සහිතව අධ්‍යයනය කිරීම මගින් සංවේදනය, හැඟීම් සහ රූප වැනි වූ සංඥානනයේ මූලික සංඝටක පරීක්ෂා කිරීම සඳහා යොදා ගැනුණි. මහාචාර්ය වුන්ඩ්ට්ගේ ශිෂ්‍යයකු වූ, පසු කලෙක තම මනෝවිද්‍යාත්මක කටයුතු පිළිබඳ ප්‍රසිද්ධියක් ලද එඩ්වඩ් ටික්නර් (Edward Tichner) ඇමරිකාවට පිටත්ව ගොස් එහිදී තමාගේම පර්යේෂණ කටයුතුවල නිරතවිය. ගණිත ගැටලුවකදී මෙන් විෂයයට යමක් සිදුකළ හැකි වුවද ඔවුන් එය සිදු කළේ කෙසේදැයි සැමවිටම විස්තර කිරීමට ඔවුනට හැකියාව නොලැබුණු බව කෙටි කාලයක් තුළ වටහා ගැනීමට හෙතෙම සමත් විය. එහෙයින්, විස්තර කිරීමට නොහැකි හෝ වටහා ගැනීමට නොහැකි හෝ සවිඥානක ක්‍රියාවලියක් තිබෙන බව ඔහුට මෙහිලා වැටහී ගියේය.



එඩ්වඩ් ටික්නර්

## "කාර්යබද්ධවාදය" (Functionalism)

කෙටි කලෙකින් "ව්‍යුහ මනෝවිද්‍යාව" පරිශීලනය කිරීමේදී මෙන් මනෝවිද්‍යාත්මක අංග වර්ධනය වූයේ කෙසේදැයි සලකා බලනවාට වඩා සත්වයින් සහ මිනිසුන් තම තමන්ට හිමිවී තිබෙන විවිධ මනෝවිද්‍යාත්මක ආකාර හිමිකරගෙන ඇත්තේ කෙසේදැයි යන්න සොයාබැලෙන "කාර්යබද්ධවාදය" ලෙස නම් කෙරුණු මනෝවිද්‍යාවේ තවත් නිකායක් බිහිවිය. හාර්වර්ඩ් විශ්ව විද්‍යාලයේ විලියම් ජේම්ස් විසින් මෙහෙයවන ලදුව "කාර්යබද්ධවාදය" මගින් ව්‍යුහයට එදිරිව සංඥානනයේ කාර්යය හෝ අරමුණු හෝ විමසා බැලීම ආරම්භ කෙරුණි. පරම්පරා ගණනාවකට අයත් මනෝවිද්‍යාඥයන්හට සම්මත කියවීම් ග්‍රන්ථයක් බවට පත් වූ සහ මෙම විෂයයේ ඉතිහාසය තුළ බලපෑමක් සිදු කළ හැකි ග්‍රන්ථයක් වූ "මනෝවිද්‍යාවේ මූලධර්ම" නම් වූ ග්‍රන්ථය ජේම්ස්, 1890 වර්ෂයේදී රචනා කළේය. කාර්යබද්ධවාදය නම් වූ මනෝවිද්‍යාවේ මෙම නිකායට අයත් සිසුන් සවිඥානකතාවයේ අංග නොව එහි ගලායන ස්වභාවය වටහා ගත යුතු විය. ඩාර්වින්ගේ ස්වභාවිකවරණවාදය පවා මනෝවිද්‍යාවට අනුගත වීම සහ දර්ශීය මනෝවිද්‍යාත්මක ලක්ෂණ යම් අරමුණක් සඳහා තිබීම ප්‍රයෝජනවත් හෝ කෘත්‍යාත්මක හෝ වන බවක් ඔවුහු විශ්වාස කළහ. යමෙකුට වේගයෙන් දිවීම සිදුකළ හැකිවීම සඳහා ශක්තිමත් මාංශපේශි වර්ධනය කරගැනීම වැනි වූ භෞතික ලක්ෂණයක ආකාරයටම මානව අත්දැකීමක අදාළ කාර්යයක් සඳහා සේවය සැලසීමට නම් මිනිස් මොළය ඒ සඳහා අනුහුරු විය යුතු බව ද ඔවුහු විශ්වාස කළහ. මානසික පරීක්ෂාව, සංවර්ධනයෙහි රටාවන්, කාර්යක්ෂම අධ්‍යාපනික පුරුදු, සහ ලිංග අතර හැසිරීමේ වෙනස්කම් යනාදිය පිළිබඳ උනන්දුවක් ඇතිකිරීමට මග පාදනු ලැබුවේ මෙකී ප්‍රවේශය මගිනි. මෙම චින්තන රේඛාව, ඩාර්වින්ගේ පරිණාමවාදයට බොහෝ සේ අනුකූල වූ, යම් පුද්ගලයකු හට සමාජයේ නොනැසී පැවැත්මට වාසිදායක තත්වයක් ලබාදෙන, "යෝග්‍යතාවය" හෝ "අදහස් හුවමාරු කරගැනීමේ" හැකියාව මගින් ජනතාව තුළ මනෝවිද්‍යාත්මක උපලක්ෂණ වරණයකට ලක්ව තෝරා ගැනෙන්නේය යන උපකල්පනය හෝ අදහස හෝ මත පදනම් වූ මනෝවිද්‍යාවකට මග පෑදීය. එහෙයින්, ව්‍යුහ මනෝවිද්‍යාඥයින් විසින් විද්‍යාගාර පර්යේෂණ හඳුන්වා දෙනු ලැබූ අතර කාර්යබද්ධවාද මනෝවිද්‍යාඥයින් විසින් නූතන මනෝවිද්‍යා නිකාය ද්විත්වයක්, එනම්, **01)** ව්‍යවහාර මනෝවිද්‍යාව සහ **02)** චර්යාවාදය හඳුන්වාදෙනු ලැබීය.

## චර්යාවාදය (Behaviouralism)


චර්යාව වටහා ගැනීමට මනෝගතික ප්‍රවේශය හඳුන්වාදුන් සිග්මන් ෆ්‍රොයිඩ් විසින් 19 වන ශතවර්ෂයේදී මනෝවිද්‍යා ක්ෂේත්‍රයට විශාල දායකත්වයක් ලබා දෙන ලදී. සිග්මන් ෆ්‍රොයිඩ් තම රෝගීන් දීර්ඝ විශ්ලේෂණයකට ලක් කිරීමෙන් අනතුරුව 'සවිඥානක පෘෂ්ඨයට බෙහෙවින් පහළ මට්ටමකට පිහිටි සිතිවිලි, මතක සහ ආශාවන් යන දෑ හැසිරීම මත ඉමහත් බලවේගයක් ඇති කරන්නේය' යන සිද්ධාන්තය ඉදිරිපත් කළේය. අවිඥානික මට්ටමින් පවතින්නා වූ පුද්ගලික හැඟීම් මගින් මනෝවිද්‍යාත්මක කැළඹීම් ඇති කෙරෙන බව ඔහු අනුමාන කළේය. එහෙයින්, හැසිරීමේ අවිඥානික තීරණ පිළිබඳ අවධානව යොමු කරමින්, භෞර්ෂය, පෙළඹවීම සහ මානසික ආබාධ පැහැදිලි කිරීමට ප්‍රයන්ත දරණ මනෝ විශ්ලේෂණාත්මක සිද්ධාන්තයේ මතුවීම සිදු විය. මිනිසා තම සිතෙහි ස්වාමියා නොවන බව මෙමගින් පෙන්නුම් කරන ලද අතර තම ලිංගික ආශාවන් සමග මිනිසුන් කටයුතු කරන්නේ කෙසේද යන්න මගින් චර්යාව පෘථුල ලෙස බලපෑමකට ලක්වෙන බව තවදුරටත් හෙතෙම යෝජනා කර සිටියේය. මෙම අදහස් එකල උණුසුම් වාදවිවාදවලට මග පෑදූ

අතර ඇතැමෙක් එය නින්දාවක් කොට සැලකූහ.

විෂය මූලික ලෙස සිදුකිරීමට අපහසු කර්තව්‍යයක් වූ මනස පිළිබඳ හැදෑරීම, චර්යාව පිළිබඳව අවධානය යොමුකිරීම බවට පරිවර්තනය වූ මනෝවිද්‍යාවේ තවත් එක් චින්තනධාරාවක් 19 වැනි සියවසේ පසු භාගයේදී මතුව ආයේය. "චර්යාවාදීන්" ලෙසින් හඳුන්වනු ලැබූ මොවුන්ගේ තර්කනයට අනුව, අධීක්ෂණයට වඩාත් අපහසු වූ "චර්යාව ක්‍රියාවට නැංවීමට මනස මූලික වන ආකාරය" පිළිබඳ දැනුමකින් තොරව යමෙකුට චර්යාව හැදෑරීමට සහ වටහාගැනීමට හැකියාව තිබේ. පළමු චර්යාවාදියා සමහර විට ඇමෙරිකානු මනෝවිද්‍යාඥ, ජේ.බී. වොට්සන් විය හැකි වන අතර තමාට ආහාර



ලබාදෙන අවස්ථාවේදී නැගෙන ශබ්දයට අනුරූප වූ හඬක් නැගුණු විට සුනඛයින්ගේ මුඛයෙන් බේටය වැගිරෙන බව විදහා දක්වන ලද රුසියානු මනෝවිද්‍යාඥ ඉවාන් පැව්ලොව්ගේ ආභාෂය ඔහුට ලැබී තිබුණි. විසිවන (20) ශතවර්ෂයේ ජීවත් වූ ස්කිනර් (Skinner) අභ්‍යන්තර සිතිවිලි විද්‍යාත්මකව අධ්‍යයනය කළ නොහැකිය යන අදහස දැරූ අතර පරිසර සාධක හැසිරීම මත ඇතිවන බලපෑමෙන් එය හැඩගැස්වෙන බව තරයේ අවධානයට ලක් කළේය. ඔහු චර්යාවාදයේ පොදු මූලධර්ම, ළමුන් සඳහා ඉගැන්වීම සිදු කෙරෙන ආකාරය වැඩිදියුණු කිරීමට සහ සාමකාමී සහ ඵලදායී සමාජයක් නිර්මාණය කිරීම පිණිස මග සොයාගැනීම සඳහා යොදා ගැනීමට කටයුතු කළේය. "නිදහසට සහ ගරුත්වයට එපිටින්" (Beyond freedom and dignity) නම් වූ ඔහුගේ ග්‍රන්ථය මගින් ස්කිනර්, ධනාත්මක ප්‍රතිඵලවලට මගපාදන ප්‍රතිචාරයක් නැවතත් සිදුකිරීමට ජීවීන්



නැඹුරුතාවයක් දක්වන බවත්, උදාසීන හෝ සෘණාත්මක හෝ ප්‍රතිඵලවලට මගපාදන ප්‍රතිචාර එලෙස නැවත සිදුනොකිරීමේ නැඹුරුතාවයක් දක්වන බවත් විස්තර කරනු ලබයි.

## මනෝවිද්‍යාවේ යොදාගැනීම්


මනෝවිද්‍යාව ශතවර්ෂ ගණනාවක් තිස්සේ විකාශයට පත් වුවද පළමු ලෝක යුද්ධයවන තෙක් ප්‍රයෝගික ගැටලු විසඳීම සඳහා යොදා ගනු ලැබුවේ මඳ වශයෙනි. පශ්චාත් ලෝක යුධ සමයෙහි මනෝවිද්‍යාඥයෝ මිනිසුන්ගේ ජීවිත කාලය තුළදී ඇතිවූ ගැටලු විසඳීම පිණිස මනෝවිද්‍යාව පිළිබඳ දැනුම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම ආරම්භ කළහ. කාලයත් සමග, **1)** ශායනික මනෝවිද්‍යාව; **2)** උපදේශනය; **3)** අධ්‍යාපනික සහ පාසල්; සහ **4)** කාර්මික හා ආයතනික ලෙස මනෝවිද්‍යාවේ වෘත්තීමය විශේෂතාවයන් සතරක් ඇතිවිය.

මනෝවිද්‍යාත්මක ආබාධ තුලනය, රෝග නිශ්චය සහ ප්‍රතිකාර කිරීම පිළිබඳව ශායනික මනෝවිද්‍යාව කටයුතු කරයි. උපදේශන මනෝවිද්‍යාව, වෛවාහක උපදේශනය, පාසල් උපදේශනය වැනි මධ්‍යම ප්‍රමාණයේ දරුණුතාවයකින් යුත් ගැටලු සමග අරගලයක යෙදී සිටින මිනිසුනට පිටිවහලක්වේ. අධ්‍යාපනික සහ පාඨශාලීය මනෝවිද්‍යාව පාසල්වල ඉගැන්වීම, විෂයමාලාව, ගුරුපුහුණුව යනාදිය වැඩිදියුණු කිරීමට කටයුතු කරයි. එමෙන්ම, කාර්මික සහ ආයතනික මනෝවිද්‍යාව, මානව සම්පත් දෙපාර්තමේන්තු පවත්වා ගැනීම, කාර්යමණ්ඩලවල චිත්ත ධෛර්යය මෙන්ම ආකල්ප වර්ධනය, වෘත්තීය සන්තෘප්තිය සහ නිෂ්පාදිතතාවය වැඩිදියුණු කිරීම, ආයතනික ව්‍යුහයන් සහ ක්‍රියාපටිපාටි පරීක්ෂා කිරීම, අභිවෘද්ධිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම වැනි ව්‍යාපාරික ලෝකයේ විවිධ වූ කාර්යයන් සමග කටයුතු කරයි.

## මනෝවිද්‍යාවේ මානවවාදී ගමනය

ප්‍රවේශයේදී යාන්ත්‍රිකවීම, සර්වාශුභවාදීවීම, සහ පෞද්ගලික කැමැත්ත සැලකිල්ලට ගැනීමට අපොහොසත්වීම යන කරුණු පදනම් කොටගෙන 1950 ගණන්වල මනෝවිශ්ලේෂණයට මෙන්ම චර්යාවාදයට එදිරිව යම් ප්‍රතිරෝධීතාවයක් මතු විය. ඒබ්‍රහම් මැස්ලෝ (Abraham Maslow) 1950 ගණන්වල අගභාගයේදී ස්වයං පිබිදවීම, නිර්මාණශීලිත්වය, පුද්ගලභාවය සහ නව මානවවාදී ප්‍රවේශය තුළ තේමාවන් බවට පත් කරලීම වැනි මාතෘකා හඳුන්වා දීම ආරම්භ කළේය. මානව චර්යාව


"ස්වකීය මතය" මගින් පාලනය වන බවත් මනෝවිද්‍යාව, මානව ස්වභාවය පිළිබඳව වඩා සර්වශුභවාදී දැක්මකට ප්‍රවේශයක් ලබා ගතයුතු බවත්, පුද්ගල සංවර්ධනය දෙසට ප්‍රබලවූ මානව එළැවුමක් පවතින බව සැලකිල්ලට ගතයුතු බවත් මානවවාදීහු සිතුහ. කාල් රොජර්ස් (Carl Rogers), රෝලෝ මේ (Rollo May) සහ එරික් ෆ්‍රොම් (Erich Fromm) මානවවාදී ප්‍රවේශයෙහිලා ප්‍රධාන දායකත්වයක් දැක්වූවන් ලෙස හැඳින්විය හැකිය.



කාල් රොජර්ස්



එරික් ෆ්‍රොම්



රෝලෝ මේ

එවක් පටන් මානවවාදී ව්‍යාපාරය මනෝවිද්‍යාවේ සංවර්ධනය මත ප්‍රබල බලපෑමක් සිදු කළ අතර මානසික සෞඛ්‍යය පිළිබඳව නව මං ඔස්සේ සිතීමටද දායකත්වයක් සැපයීය. මානව චර්යා පිළිබඳව වටහා ගැනීමට නව ප්‍රවේශයක් ඉදිරිපත්කිරීමටද එමගින් සිදුකළ අතර "ඥානන මනෝවිද්‍යාව" සහ "සාධනීය මනෝවිද්‍යාව" සංවර්ධනයටද මග පෑදීය.

## ව්‍යවහාර මනෝවිද්‍යාව සහ මනෝවිද්‍යාඥයින්ගේ කාර්යය

වර්තමානයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන මනෝවිද්‍යා මූලික උපාධිය ප්‍රදානය කරන අතර එම විෂයට අදාළ පශ්චාත් උපාධි සඳහා මූල්‍ය ප්‍රදාන ලබාදීමද සිදු කරයි. මූලික උපාධියෙන් අනතුරුව මනෝවිද්‍යා ශිෂ්‍යයින් හට ශායනික පුහුණුව; උපදේශනය; පාසල් සමග කටයුතු කිරීම වැනි අධ්‍යාපනික ක්ෂේත්‍ර; කර්මාන්ත සහ සංවිධාන සමග කටයුතු කිරීම වැනි වූ බොහොමයක් ව්‍යවහාරික මෙන්ම වෘත්තීයමය ක්ෂේත්‍රවල කටයුතු කිරීමේ පුහුණුවක් ලැබෙනු ඇත. මනස ක්‍රියාකරන ආකාරය පිළිබඳව වටහා ගැනීම හෝ දැනුවත්වීම හෝ මගින් සහ ඒ පිළිබඳව වෘත්තීයමය අත්දැකීම් ලබාගැනීමෙන් සහ එකී දැනුම යොදාගැනීමෙන් මනෝවිද්‍යාඥයෝ ඉහත සඳහන් ක්ෂේත්‍රයන්හි සහ වපසරියන්හි මතුවන මානසික ගැටලු විසඳාලීම පිණිස මිනිසුනට උපකාර කරති. අනෙක් අතට මනෝවිද්‍යාඥයෝ භාවනාව නිරතුරුව යොදාගැනීම මෙන්ම චිකිත්සාවේ විවිධ වූ වෙනත් ස්වරූප යොදාගැනීම මගින් රෝග නිශ්චය සිදුකිරීම සහ ප්‍රතිකාර සිදුකිරීම යනාදිය සිදුකරන්නාවූ වෛද්‍යවරු පිරිසක්ද වන්නාහ.

එහෙයින්, මනස ක්‍රියාකරන්නේ කෙසේද යන්න පිළිබඳව වටහා ගැනීම පිණිස වූ කුතුහලය සමග ආරම්භ කෙරුණු මනෝවිද්‍යා ක්ෂේත්‍රය, එකිනෙක මගින්, තවත් එක් නිකායකට හෝ මනෝවිද්‍යාවේ ශාඛාවකට මග පාදමින් විවිධ වූ සිද්ධාන්තයන් පිළිබඳව පර්යේෂණය සිදු කරනු ලබන සහ ඒවා විස්තර සහිතව ඉදිරිපත් කරනු ලබන මනෝවිද්‍යාඥයන් සමග ක්‍රමයෙන් විකාසයට පත්වුණි. අනෙකුත් බොහෝ විද්‍යාවන් සමග මෙන්ම, දැනුම් හෝ සිද්ධාන්ත හෝ පදනම වැඩෙන විට, මනසේ, ඉගැනුම් - උගැන්වීම් කාර්යයයේ, හෝ කර්තව්‍යය හෝ පිළිබඳව වූ ඉහත දැනුම මානවයාගේ ජීවිත කාලය තුළ හමුවන ගැටලු විසඳීම සඳහා යොදා ගැනීම ආරම්භ විය. අද වන විට ඉතාමත් විශේෂිත ක්ෂේත්‍රවල කටයුතු, විෂයය පර්යේෂණයට ලක් කරමින් එමෙන්ම ගැටලු විසඳීමට සහ මානව ජීවිතවල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා මනෝවිද්‍යාඥයෝ දායකවෙමින් සිටිති.



මානසික සෞඛ්‍යය පිළිබඳ ජාතික සභාවේ සභාපති
විශේෂඥ මනෝචිකිත්සක
**වෛද්‍ය නිරෝෂන් මෙන්ඩිස්**